*2017 ජුනි 6 වැනි දිනට ශ්‍රී ලංකාව ඇතුළත් දකුණු ආසියානු සහ ගිනිකොණ දිග ආසියානු රටවල් කණ්ඩායමක් එකතුව පිහිටුවා ගත් බිම්ස්ටෙක් (BIMSTEC ) සංවිධානයට වසර 20ක් සපිරේ. මෙම අවස්ථාව සනිටුහන් කිරීමට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක ආචාර්ය කැලේගම මහතා බිම්ස්ටෙක් හි මූලික කාර්ය සාධන ලක්ෂණ දෙකක් වන වෙළඳ පොළ පදනම් අන්තර්ග්‍රහණය සහ ආණ්ඩුව පදනම් අන්තර්ග්‍රහණය කලාපයේ ඉක්මන් සාර්ථකත්වය සඳහා වරණාත්මකව යොදා ගත යුතුයැයි තර්ක කරයි.*

## බෙංගාල බොක්ක ප්‍රදේශයේ කලාපීය ආර්ථික අන්තර්ග්‍රහණය.

**සමන් කැලේගම**

දකුණු සහ නැගෙනහිර ආසියාව ඇතුළත් වන බෙංගාල බොක්ක ප්‍රදේශය ස්වභාවික සම්පත්වලින් පොහොසත් ය. බංග්ලාදේශය, චීනය, ඉන්දියාව සහ මියන්මාරය (BCIM ) සහ බංග්ලාදේශය, භූටානය, නේපාලය සහ ඉන්දියාව (BBNI) යන එකතුන් කලාපය අඩ වශයෙන් ආවරණය කරන නමුත් සම්පූර්ණ කලාපයම ආවරණය වන්නේත්, කලාපීය ආර්ථික අන්තර්ග්‍රහණයකට රාමුවක් සැපයෙන්නේත් බහු අංශීය තාක්ෂණ සහ ආර්ථික සහයෝගිතාවය සඳහා වූ බෙංගාල බොක්ක මුලපිරුමෙන් ( BIMSTEC ) පමණි.

බිම්ස්ටෙක් ද.දේ.නිෂ්පාදිතයෙන් එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 2.7කට, ගෝලීය ජන සංඛ්‍යාවෙන් සියයට 21කට ( බිලියන 1.3ක ජන සංඛ්‍යාවක්) සහ සියයට 7ක අන්තර් කලාපීය වෙළඳාමකට වගකියයි. බිම්ස්ටෙක් මගින් දකුණු ආසියානු රටවලට නැගෙනහිර ආසියානු රටවල් හා ආර්ථික සහයෝගිතා මාර්ගයක් සහ නැගෙනහිර ආසියානු නිෂ්පාදන ජාලයන්ට සහ වටිනාකම් දාමයන්ට සම්බන්ධතාවයක් සපයයි. එය අනාගත ආසියානු ප්‍රජාවක පදනමක් බවට පත්ව ඇත. එහෙත් මෙතෙක් ප්‍රගතිය ඉතාමත් මන්දගාමී ය.

1997 දියත් කරන ලද බිම්ස්ටෙක් අඩ වශයෙන් කලාපයේ ස්වභාවික සම්පත් වඩාත් හොඳින් යොදා ගැනීමේ සහ කලාපයේ අන්තර්ග්‍රහණය කඩිනම් කිරීමේ අංශීය සහයෝගිතා එකතුවක් ලෙස ආරම්භ විය. අංශීය සහයෝගිතාවය සාමාන්‍යයෙන් බහු අංශීය සහයෝගිතාවය යනුවෙන් හැඳින්වෙන තෝරා ගත් ක්ෂේත්‍ර බොහොමයකට ව්‍යාප්ත කිරීමෙන් පුළුල් විය. එවැනි සහයෝගිතාවය ආණ්ඩුව පදනම් වන අතර එය නිදහස් වෙළඳ ගිවිසුමක් හරහා ඇතිවන වැඩියෙන්ම නිදහස් වෙළඳ පොළ (FTA ) පදනම් අන්තර්ග්‍රහණයට වෙනස් ය. බිම්ස්ටෙක් සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය, ප්‍රවාහනය වැනි අංශීය සහයෝගිතාවය සඳහා ක්ෂේත්‍ර ගණනාවක් හඳුනා ගෙන ඇත.

2004 දී නිදහස් වෙළඳ ගිවිසුමක් පිළිබඳ අදහස පළමුවෙන්ම ඉදිරිපත් වූ විට බිම්ස්ටෙක් මගින් ද වෙළඳ පොළ පදනම් අන්තර්ග්‍රහණ ක්‍රියාවලියක් අදහස් කෙරිණ. එය 2011 වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කළ ද ඒ වන විට එය යථාර්ථයක් වූයේ නැත. බොහෝ දුරට එසේ වූයේ සමහර බිම්ස්ටෙක් සමාජික රටවල් කලාපයේ තීරු බදු දැනටමත් ඉතා පහත මට්ටමක පවතින නිසා තවත් නිදහස් වෙළඳ ගිවිසුමක අවශ්‍යතාවය ප්‍රශ්න කළ නිසාය. කලාපයේ ඒක පාර්ශ්වීය ලිහිල්කරණය මෙන්ම පවතින නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළඳ වැඩ සටහන් ( RTA) හරහා ද්වි පාර්ශ්වීය සහ

කලාපීය ලිහිල්කරණයයෙන් තීරු බදු මට්ටම් පහත දැමූ බව ප්‍රකටය. මෙම ආරවුල නිසා ප්‍රමාද වූ බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ගිවිසුම තවමත් න්‍යාය පත්‍රයට සීමාව පවතී.

මෙහි දී බිම්ස්ටෙක්හි ප්‍රධාන කාර්ය සාධන ලක්ෂණ දෙක වන වෙළඳ පොළ පදනම් අන්තර්ග්‍රහණය සහ ආණ්ඩුව පදනම් අන්තර්ග්‍රහණය කලාපයේ ඉක්මන් සාර්ථකත්වය සඳහා වරණාත්මකව යොදා ගත යුතුය.

වෙළඳ පොළ අන්තර්ග්‍රහණය සඳහා බිම්ස්ටෙක් නිදහස් වෙළඳ ගිවිසුමක් ක්‍රියාත්මක වනු ඇතැයි මහත් බලාපොරොත්තු ඇති කර ගත යුතු නොවේ. මෙවැනි තත්වයක දී වඩාත් අවධාණය යොමු කළ යුතු වන්නේ නිදහස් සංක්‍රමණ, ව්‍යාපාර හිතකර රේගු, ප්‍රවාහන කලාප තුළින් වෙළඳ පහසුකරණයක් කෙරේය. එවැනි ක්‍රියාවලියකින් කලාපයේ තීරු බදු නොවන බාධක සමහරකට විසඳුම් වන අතර වෙළඳාම වේගවත් වනු ඇත.

ආණ්ඩුව පදනම් අන්තර්ග්‍රහණය සඳහා අංශීය සහයෝගිතා ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් කෙරේ අවධානය යොමු කිරීමෙන් සම්බන්ධතාවය සහ මිනිසුන් මිනිසුන් අතර බැඳීම ලිහිල් කිරීම වෙනුවට අංශීය සහයෝගිතාවයට අදාල ව්‍යාපෘති කිපයක් කෙරේ යොමුවීම ප්‍රඥාගෝචරය. ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යයනයක් වන බිම්ස්ටෙක් ප්‍රවාහන යටිතල පහසුකම් සහ කාර්ය සාධන අධ්‍යයනය (BTILS ) ඉස්මතු කළ ආකාරයට මාර්ග සහ දුම්රිය සම්බන්ධතා, ප්‍රවාහන කලාප, විවිධ කේන්ද්‍රීය පද්ධතීන් ( Multi-nodal ) ප්‍රවාහන වැඩ පිළිවෙල වැනි අංශ හරහා මහා මාර්ග, දුම්රිය මාර්ග පහසුකරණයෙන් සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුය. සමහර විට භෞතික සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට ඩිජිටල් සම්බන්ධතාවය සැලකිල්ලට ගත හැකිය. මිනිසුන් මිනිසුන් අතර බැඳීම් කලාපයේ අන්තර් ආණ්ඩු සහයෝගිතාවය හරහා ගුවන් සම්බන්ධතා සහ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයෙන් වැඩි දියුණු කළ හැකිය. බිම්ස්ටෙක් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා එවැනි නිදසුනක් වන්නේ බෞද්ධ සංචාර යි.

ආංශීය සහයෝගිතාවය ඵලදායී වීමට නම් ප්‍රබල ආයතන සහ තොරතුරු තිබිය යුතුය. අවධානය යොමු විය යුතු ක්ෂේත්‍ර හතරකි. බිම්ස්ටෙක් ලේකම් කාර්යංශය, බිම්ස්ටෙක් වානිජ සහ කර්මාන්ත මණ්ඩලය, ආසියානු සංවර්ධන බැංකුව, එස්කැප් (ESCAP ) වැනි බාහිර හවුල්කරුවන් සහ බිම්ස්ටෙක් බුද්ධි මණ්ඩල ජාල සමග බිම්ස්ටෙක් නිලධාරීන්ගේ සම්බන්ධතා සහ බිම්ස්ටෙක් මණ්ඩලය.

ප්‍රබල ලේකම් කාර්යංශයක් අවශ්‍ය වන්නේ නායක හමු අතර කාලයේ දී කලාපීය කණ්ඩායමේ ක්‍රියාකාරකම් පවත්වා ගැනිම සඳහාය. සාර්ක් ලේකම් කාර්යංශය අකාර්යක්ෂම ආයතනයක් වන අතර ආසියාන් ලේකම් කාර්යංශයට එම සංවිධානයේ ආසියාන් න්‍යාය පත්‍රය වඩාත් සාර්ථකව ගෙන යෑමට හැකිව ඇත. බිම්ස්ටක් ලේකම් කාර්යංශය ද ආසියාන් ලේකම් කාර්යංශය මෙන් බලාත්මක කළ යුතු අතර බිම්ස්ටෙක් න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යෑමට වඩාත් ඉදිරිගාමී භූමිකාවක් ඉටු කිරීමට සාමාජික රාජ්‍යයන් විසින් බලය ලබා දිය යුතුය. මෙය වඩාත් වැදගත් වන්නේ බිම්ස්ටෙක් සංවිධානයට ප්‍රඥප්තියක් නැති නිසාය.

බිම්ස්ටෙක් ක්‍රියාත්මක යාන්ත්‍රණයේ ස්ථර හයක් පවතී. නායක හමුව, අමාත්‍ය රැස්වීම්, ජ්‍යෙෂ්ඨ නිලධාරි රැස්වීම්, විශේෂඥ කණ්ඩායම් රැස්වීම්, ව්‍යාපාර සහ ආර්ථික මණ්ඩප සහ බිම්ස්ටෙක් ක්‍රියාකාරී කණ්ඩායම ( Bwg ) මූලික වශයෙන් නායක හමු සිට විශේෂඥ කණ්ඩායම් රැස්වීම් දක්වා අන්තර් ආණ්ඩු මට්ටමෙන් සිදු වේ. නව බිම්ස්ටෙක් ලේකම් කාර්යංශය ක්‍රියාකාරී කණ්ඩායමේ සියලු වැඩ අත්පත් කර ගෙන ඇත. මූලික වශයෙන් ව්‍යාපාර සහ ආර්ථික මණ්ඩප ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි බිම්ස්ටෙක් වානිජ සහ කර්මාන්ත මණ්ඩලයට ඇතුළත් විය යුතුය. එම මණ්ඩලය බිම්ස්ටෙක් ලේකම් කාර්යංශය සමග සමීපව සම්බන්ධීකරණය විය යුතු අතර බිම්ස්ටෙක් ආර්ථික අන්තර්ග්‍රහණ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යා යුතුය.

බිම්ස්ටෙක් නායක හමු වාර්ෂිකව පැවැත්වීමට CUTS (ඉන්දියාව) කර ඇති යෝජනාව සතුටින් පිළිගත යුතු අතර එය බිම්ස්ටෙක් මණ්ඩලය සමග සමීපව සම්බන්ධීකරණය විය යුතුය.

බිම්ස්ටෙක් කලාපීය අන්තර්ග්‍රහණයේ බාහිර අරමුදල් දායකයා ආසියානු සංවර්ධන බැංකුව විය හැකිය. මහා මීකොං උප කලාපයේ, උප කලාපීය සහයෝගිතාවය පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව ඉටු කළ භූමිකාව ප්‍රකටය. බිම්ස්ටෙක් සාමාජික රටවල ඒකාග්‍රතාවය ඇතිව ආසියානු සංවර්ධන බැංකුවට BTILS ව්‍යාපෘති මුල පිරිය හැකිය. ඉන් පසුව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අතිරේක අරමුදල් සොයා ගැනීම ගැටලුවක් නොවනු ඇත. කෙසේ වුවත් BCIM සහ BBNI මුලපිරුම් සමග එකම දේ නැවත කිරීම වැළැක්විය යුතුය. කලකට පෙර ESCAP යෝජනා කරන ලද ආසියානු මහා මාර්ගය බිම්ස්ටෙක් සම්බන්ධතාවයේ කොටසක් විය හැකි අතර ESCAP සංවිධානයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණ සහාය ලබා දිය හැකිය. ආසියාන් ආර්ථික අන්තර්ග්‍රහණයේ දී ජපානයේ ඍජු විදේශ ආයෝජන (FDI ) මූලික භූමිකාවක් ඉටු කළ ආකාරයට බිම්ස්ටෙක් ආර්ථික අන්තර්ග්‍රහණයේ දී ආසියානු සංවර්ධන බැංකුවට සහ වෙනත් බාහිර අරමුදල් සපයන ආයතන මූලිකත්වයෙන් සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම වේගවත් කළ හැකිය.

අවසාන වශයෙන් කලාපීය ආර්ථික අන්තර්ග්‍රහණයේ දී බුද්ධි මණ්ඩපවල භූමිකාව නොසලකා සිටිය නොහැකිය. ඒවාට බිම්ස්ටෙක් දැනුම් හවුල්කරුවන් වශයෙන් අතිශය වැදගත් භූමිකාවක් ඉටු කළ හැකිය. බිම්ස්ටෙක් සඳහා පළමු වැනි සහ දෙවැනි තල ( Track 1 and 2 ) යන දෙකේම බුද්ධි මණ්ඩල ජාලයන් පවතින බවට අවබෝධයක් ඇත. මෙම තල දෙකටම එකිනෙක සමග ක්‍රියා කළ හැකි අතර අංශීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති වෙනස්කම් ඇති කිරීමට බිම්ස්ටෙක් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ පුද්ගලික අංශය සමග ජාල ගතවිය හැකිය.

බිම්ස්ටෙක් ආරම්භ කරන විට ඉන්දියාවේ ''පෙරදිග දෙස බලමු'' ප්‍රතිපත්තිය තායිලන්තයේ ''බටහිර දෙස බලමු'' ප්‍රතිපත්තිය සමග ගැලපීමක් තිබුණ අතර මෙම සාමාජික රටවල් දෙක දකුණු ආසියාවේ කොටසක් නැගෙනහිර ආසියාවේ වර්ධනය වන ආර්ථිකයන් සමග අන්තර්ග්‍රහණය වීම සංවිධානය ක්‍රියාත්මක කරනු ඇතැයි මහත් උද්‍යෝගයක් තිබිණ. එහෙත් ඉන් පසුව තායිලන්තය ඉන්දියාව සමග නිදහස් වෙළඳ ගිවිසුමක් ඇති කර ගත්තේය. ඉන්දියාව සහ ආසියාන් හවුල නිදහස් වෙළඳ ගිවිසුමක් ක්‍රියාත්මක කෙරිණ. ඒ අනුව මෙම සාමාජික රටවල් දෙකේම සංවිධානය කලින් මෙන් ගැඹුරු අන්තර්ග්‍රහණයක් කරා ගෙන යෑමට පෙර පැවති උද්‍යෝගය නැත. අනෙක් සාමාජික රටවලට එතරම් බලයක් නැත. ඔවුන් බිම්ස්ටෙක් හි නිහඬ සාමාජිකයන් ය. බිම්ස්ටෙක් තව දුරටත් සාමාජික රටවල උනන්දුවෙන් ක්‍රියාත්මක වන සංවිධානයක් නොවේ. එවැනි තත්වයක් තුළ ලේකම් කාර්යංශය සංවිධානය ක්‍රියාත්මක කිරීමේ දී අතිශයෙන් වැදගත් ය. පැහැදිලිවම බිම්ස්ටෙක් වැඩ සටහන පවත්වා ගැනීමටත් බෙංගාල බොක්ක කලාපයේ ජනතාවට ඉන් ඵල ප්‍රයෝජනයක් අත් කර දීමටත් බිම්ස්ටෙක් ලේකම් කාර්යංශය බලාත්මක කිරීම සාමාජික රටවල ප්‍රමුඛතාවය විය යුතුය.

(2016 පෙබරවාරි 19 වැනි දා ඩකා හි බිම්ස්ටෙක් ලේකම් කාර්යංශයේ දී පැවැත් වූ දේශනයේ සාරාංශයක්)

මෙම ලේඛකයා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂක වරයාය.